# දැන්වීමයි
## නාගරික සංවර්ධන අධිකාරිය

**නාගරික සංවර්ධන අධිකාරි පනතේ 23(5) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව පළාත් පාලන ආයතන වෙත බලතල අභිනියෝජනය කිරීම සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීමයි.**

අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් 2020.01.30 වන දින අනුමත කරන ලද අංක 01/2020 කළමනාකරණ මණ්ඩල තීරණය පරිදි හා නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් ගරු අමාත්‍යතුමාගේ නියෝගය පරිදි 1982 අංක 04 දරණ පනතින් සංශෝධිත 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරියේ පනතේ 23(5) වගන්තිය ප්‍රකාරව මෙම අධිකාරිය විසින් නිකුත් කරන ලද DDG/P/01/11 හා 2017.02.08 දිනැති චක්‍ර ලේඛය සහ 2017.12.13 දිනැති සැලසුම් චක්‍ර ලේඛ අංක 28 මගින් පළාත් පාලන ආයතනයන්ගෙන් පවරා ගන්නා ලද බලතල වලින්, පහත සඳහන් අංක 1 ආයිතමයේ සඳහන් සැලසුම් කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය පටිපාටියට අදාල **<u>" 1.1 සිට 1.11 දක්වා වූ අනු කොටස් හී විෂය පථයන්ට අදාල සියළු කාරණාවන් හැර"</u>** අනෙකුත් බලතල සියළුම පළාත් පාලන ආයතන වෙත 2020.03.01 දින සිට නැවත අභිනියෝජනය කරනු ලැබේ.

1.

   1.1 සියලුම සංවර්ධන කටයුතු සඳහා මුලික සැලසුම් නිරාකරණ නිකුත් කිරීම.

   1.2 මහල් 5 (G+4) – අතරමැදි උස (Inter Medium Height) සහ ඊට වැඩි සියලුම සංවර්ධන කටයුතු කාර්යයන් සඳහා වන ගොඩනැගිලි අයදුම්පත් භාර ගැනීම්, අයදුම්පත් පෙරසැරි කිරීම්, පෙරසැරි ගාස්තු අය කිරීම හා අනුමත කිරීම.

   1.3 මහල් 5 (G+4) – අතරමැදි උස (Inter Medium Height) සහ ඊට වැඩි සියලුම ගොඩනැගිලි සඳහා වන අනුකුලතා සහතිකයට අදාල අයදුම්පත් භාර ගැනීම, අයදුම්පත් පෙරසැරි කිරිම, පෙරසැරි ගාස්තු අය කිරිම හා අනුකුලතා සහතිකයන් ලබා දීම.

   1.4 මහ නගර සභා හා නගර සභා බලප්‍රදේශ තුල අක්කර 1 ට වැඩි සියලුම ඉඩම් කොටස් සංවර්ධනය කිරිම සම්බන්ධව අනුබෙදුම් අයදුම්පත් භාර ගැනීම, පෙරසැරි කිරීම, පෙරසැරි ගාස්තු අයකිරිම සහ අනුමත කිරිම.

   1.5 සියළුම සංවර්ධන කටයුතු සඳහා භාවිතය වෙනස් කිරීම් වලට අදාල අනුමැතීන් ලබා දීම.

   1.6 නාගරික සංවර්ධන අධිකාරිය මගින් හඳුනාගනු ලැබූ හා ඉදිරියේදී හඳුනාගනු ලබන ජාතික හා ප්‍රාදේශීය වශයෙන් වටිනාකම් ඇති ස්ථානවල කරනු ලැබීමට යෝජිත විශේෂ ව්‍යාපෘති / සංවර්ධන කටයුතු

   1.7 අධිවේගී මාර්ගයන් හී ආරක්ෂිත කලාපවල (Buffer Zone) යෝජිත සංවර්ධන කටයුතු

   1.8 වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය සඳහා වැදගත් යැයි හඳුනාගනු ලබන ප්‍රදේශ තුල යෝජිත සංවර්ධන කටයුතු

   1.9 ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය මගින් හඳුනාගනු ලබන අවදානම් සහිත හා පාරිසරික සංවේදී කලාප තුල පිහිටි ප්‍රදේශ වල සංවර්ධන කටයුතු

   1.10 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හරහා යොමු කරනු ලබන සංවර්ධන කටයුතු

   1.11 ආයෝජන මණ්ඩලය හරහා යොමු කරනු ලබන සංවර්ධන කටයුතු

2. ඉහත කාණ්ඩ වලට අයත් නොවන සියලුම ඉඩම් අනුබෙදුම් සඳහා අනුමැතිය ලබාදීම, සියලුම සංවර්ධන බලපත්‍ර සහ අනුකුලතා සහතිකය නිකුත් කිරීම, 2020 මාර්තු 01 දිනට පසු අදාළ පලාත් පාලන ආයතන හරහා සිදු කර ගත යුතුය.

3. 2020 මාර්තු 01 දිනට පෙර නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාරදී ඇති අයදුම්පත් පෙරසැරි කිරීම, අනුමත කිරීම, බලපත්‍ර නිකුත් කිරීම, කාලය දීර්ඝ කිරීම, වෙනස් කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම නාගරික සංවර්ධන අධිකාරිය විසින්ම සිදු කරනු ඇත.

4. ඉහත අංක 1.4 අනු අංකය යටතේ දක්වා ඇති සැලසුම් කිරීමේ හා සංවර්ධනය කිරීමේ විෂය පථයට අදාලව හෙක්ටයාර 01 ට වඩා වැඩි විශාලත්වයෙන් යුතු ඉඩම් සංවර්ධනය කිරීමේදී, නාගරික සංවර්ධන අධිකාරී රෙගුලාසි ප්‍රකාරව, ඉඩමේ හෝ භූමි භාගයේ විශාලත්වයෙන් වෙන් කරනු ලබන 10% ප්‍රජා හා විනෝද කටයුතු සඳහා වන ඉඩම් කොටස භාර ගැනීම අදාල පළාත් පාලන ආයතන වෙත පවරනු ලැබේ.

5. සැලසුම් කිරීමේ කාර්ය පටිපාටියට අදාලව, නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් අදාල පළාත් පාලන ආයතනය ක්‍රියාත්මක වීමේදී අධිකාරියේ විධානය, අධීක්ෂණය හා පාලනයට යටත්ව සිදු කල යුතුය.

6. මෙම චක්‍රලේඛණය නිකුත් කිරීම හේතුවෙන් මෙම අධිකාරිය විසින් නිකුත් කරන ලද DDG/P/01/11 හා 2017.02.08 දිනැති චක්‍ර ලේඛණය, 2017.12.13 දිනැති සැලසුම් චක්‍ර ලේඛණ අංක 28 මගින් පවරා ගන්නා ලද බලය අනුව මේ දක්වා සිදුකරන ලද සියළු ක්‍රියා හා අනුශාංගික කාර්යයන් හා කර්තව්‍යයන් වලංගු වන බවත්, බලාන්විත වන බවත් අවිච්ඡින්නව පැවැත්වේ.

වැඩිදුර විස්තර නාගරික සංවර්ධන අධිකාරියේ පහත සඳහන් කාර්යාල ඇමතීමෙන් ලබා ගත හැක.

| | කාර්යාලය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|
| 01. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, | 6 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල | 0112866336 |
| 02. | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) | 9 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල | 0112871502 |
| 03. | අධ්‍යක්ෂ(බස්නාහිර පළාත) | 9 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල | 0112863101 |
| 04 | අධ්‍යක්ෂ(කොළඹ මහ නාගරික ප්‍රදේශය) | 9 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල | 0112872616 |
| 05 | වයඹ පළාත් කාර්යාලය | අංක 310 ඩී , මීගමුව පාර, කුරුණෑගල | 0372230134 |
| 06 | මධ්‍යම පළාත් කාර්යාලය | අංක 18, කැප්පෙටිපොල මාවත, මහනුවර | 0812223851 |
| 07 | ඌව පළාත් කාර්යාලය | නො. 08, මැදිරිය පාර, බදුල්ල | 0552223721 |
| 08. | සබරගමුව පළාත් කාර්යාලය | අංක 427, කොළඹ පාර, නව නගරය, රත්නපුර | 0452225690 |
| 09 | නැගෙනහිර පළාත් කාර්යාලය | අංක 56, දුම්රියපල පාර, ත්‍රිකුණාමලය | 0262223097 |
| 10. | උතුරු පළාත් කාර්යාලය | අංක 134, දුම්රියපල පාර, යාපනය | 0212223269 |
| 11 | උතුරු මැද පළාත් කාර්යාලය | අංක 521/107- II පියවර නව නගරය, අනුරාධපුර | 0252237937 |
| 12. | දකුණු පළාත් කාර්යාලය | අංක 4/8/3, හැව්ලොක් පාර, ගාල්ල | 0912245435 |
| 13 | නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය | 2 වන මහල, ක්වීන් එලිසබත් වෙළඳ සංකීර්ණය, එලිසබත් රැජින වීදිය, නුවරඑළිය | 0522223664 |
| 14 | කළුතර දිස්ත්‍රික් කාර්යාලය | අංක 326/2, ගාලු පාර, කළුතර දකුණ, කළුතර | 0342226570 |
| 15 | ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය | අංක 06, මේරි බිසෝ මාවත, ගම්පහ | 0332234757 |
| 16 | **මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය** | **තිස්ස පාර, මොණරාගල** | 0473220626 |
| 17 | කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය | අංක 10/9/C, රතබලාවත්ත, කෑගල්ල | 0352231935 |
| 18 | අම්පාර දිස්ත්‍රික් කාර්යාලය | අංක 110, ශ්‍රී ධර්මරතන මාවත, අම්පාර | 0632222411 |
| 19 | මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලය | අංක 15, පයිනියර් මාවත, මඩකලපුව | 0652227673 |
| 20 | පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය | 2වන මහල , නව සංචාරක තොරතුරු මධ්‍යස්ථානය, පොලොන්නරුව | 0272226126 |
| 21 | මාතර දිස්ත්‍රික් කාර්යාලය | අංක 71/1, එච්.පී.පී.ගොඩනැගිල්ල, පරණ මාර්කට් පාර, කොටුවේගොඩ, මාතර | 0412230413 |
| 22 | හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය | නව පරිපාලන සංකීර්ණය, 1 වන මහල, ගොන්නොරුව පාර, සිරිබෝපුර, හම්බන්තොට | 0472222069 |
| 23 | පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය, | අංක 71/90, ඩී.එ එම්. ද සිල්වා මාවත, | 0322221173 |

| | | | |
|---|---|---|---|
| | | කොළඹ පාර, හලාවත | |
| 24 | කතරගම උප කාර්යාලය | කඳසුරිදුගම, කතරගම | 0472235343 |
| 25 | දඹුල්ල උප කාර්යාලය | මහ දඹුල්ල ව්‍යාපෘති කාර්යාලය, 02 මහල, පරිපාලන සංකීර්ණය, ගම්උදා භූමිය, දඹුල්ල | 0662052433 |
| 26 | කල්මුණේ උප කාර්යාලය | කල්මුණේ මහා නගර සභාව, කල්මුණේ | 0672224250 |

සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය